**ශීර්ෂය 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 19 වෙනි දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

#### (අ) ආදායම් නොවන ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් බී ගිණුම සඳහා වර්ෂය තුල මුළු ලැබීම්වල එකතුව රු. 33,894,878 ක් වුවද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි එම අගය රු. 28,255,657 ක් ලෙස දක්වා තිබීමෙන් අත්තිකාරම් ලැබීම්වල රු.5,639,219 ක වෙනසක් විය. | ගිණුම් පිළියෙල කිරීමේ අඛණ්ඩභාවය සැලකිල්ලට ගනිමින් 2020 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අත්තිකාරම් ලැබීම් ලෙස 215011 අත්තිකාරම් ශේෂ ඇතුළත් කරමින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පිළියෙල කර ඇති බව. | භාණ්ඩාගාර පොත් අනුව සසඳා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පිළියෙල කළයුතු වීම. |

#### (ආ) පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අත්තිකාරම් බී ගිණුම සඳහා වර්ෂය තුල මුළු ගෙවීම්වල එකතුව හා සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය අනුව අත්තිකාරම් ගෙවීම් රු. 15,673,881 ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව එම වටිනාකම රු. 28,289,056 ක් වූයෙන් රු.12,615,175 ක වෙනසක් විය. | ගිණුම් පිළියෙල කිරීමේ අඛණ්ඩභාවය සැලකිල්ලට ගනිමින් 2020 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අත්තිකාරම් ගෙවීම් ලෙස 215011 යටතේ අත්තිකාරම් ශේෂ ඇතුළත් කරමින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පිළියෙල කර ඇති බව. | භාණ්ඩාගාර පොත් අනුව සසඳා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පිළියෙල කළයුතු වීම. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් ආකෘතිය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සමඟ සැසඳීමේදී වත්කම් වර්ග 09 ක ආරම්භක ශේෂ අතර රු.273,033,160 ක් ද වර්ෂය තුල මිල දී ගැනීම් අතර රු.221,652,126 ක් ද අවසාන ශේෂ අතර රු.51,381,030 ක්ද වශයෙන් නොසැසඳීම් විය. | මෙම වෙනසට හේතුව දෙසැම්බර් මස ප්‍රධාන කාර්යාලය හා තාක්ෂණ/කාර්මික විද්‍යාල විසින් ස්ථාවර වත්කම් මිලදී ගැනීම් දෙසැම්බර් 31 දින වන විට සිගාස් වැඩසටහන මඟින් ගිණුම්ගත කර අවසන් කිරීම ප්‍රායෝගිකව අපහසු බව. | අදාළ වර්ෂය තුළ දී මිලදී ගන්නා ලද මූල්‍ය නොවන වත්කම් සියල්ල අදාළ පරිගණක වැඩසටහන් තුළට එම වර්ෂය තුළදීම ඇතුළත් කිරීමට කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල ජංගම නොවන වත්කම් පිළිබද ප්‍රකාශයෙහි වටිනාකම රු.2,000,000 ක් වූ මගී වාහනය ඇතුලත් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල එම අගය අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | මෙම වාහනයේ තක්සේරු වටිනාකම ගිණුම් අංශයට තහවුරු කර නොතිබූ බැවින් ගිණුම් වලට ඇතුළත් කර නොමැති බව. | සියලුම වත්කම් ගිණුම් ගත කිරීමට කටයුතු කළයුතු වීම. |
| (ඇ) | 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් වත්කම් වර්ග 2784 ක් අපහරණය හා විකිණීමට නිර්දේශ කර තිබූ අතර එම වත්කම් රු.303,944 කට විකුණා තිබුණද ඒවාට අදාල පිරිවැය වටිනාකම් හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ වත්කම් මිලදී ගෙන ඇත්තේ වර්ෂ ගණනාවකට පෙර බැවින් එම වත්කම් වල පිරිවැය වටිනාකම ගණනය කිරීමේ අපහසුතාවයන් පවතී. නමුත් එම වත්කම් වල පිරිවැය ඇස්තමේන්තු කර ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | අපහරණය හා විකුණන ලද වත්කම් වල පිරිවැය වටිනාකම් හඳුනා ගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |
| (ඇ) | කාර්මික / තාක්ෂණ විද්‍යාල 25 ක ඉඩම් තක්සේරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම නිසා මෙම ඉඩම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කිරීමට නොහැකි වී තිබුණි. | විද්‍යාල 14 ක ඉඩම් පමණක් තක්සේරු කර ඇත. අනෙකුත් විද්‍යාල වල ඉඩම් ඉදිරියේදී තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කරන බව. | සියලුම ඉඩම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී මුදල් රෙගුලාසි 880/891 ප්‍රකාරව සේවක ඇප ලේඛණයක් පවත්වා ගැනීමට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි 891(1)හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |

(ආ) **හානි පිළිබඳ ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | හානි පාඩු ලේඛණය පවත්වා ගෙන යනු ලබන අතර අදාළ ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යාමට උපදෙස් ලබා දුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |

(ඇ) **වාහන ලොග් පොත**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාර වාහන ලොග් පොත් පවත්වා නොතිබුණි. | පවත්වා ගෙන යනු ලබන අතර අදාළ පොත් යාවත්කාලීන කිරීමට උපදෙස් ලබා දුණි. | පොදු 267 අකෘතිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම පවත්වා ගත යුතුය. |

### 1.6.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා පළමු පන්තියේ ගණකාධිකාරිවරයෙකු යටතේ කාර්යය මණ්ඩලයක් ද අනුයුක්ත කර ඇත. අභ්‍යන්තර විගණන වැඩසටහනකට අනුව සියළු අංශ විගණනයට ලක් කිරීම සිදු කරන අතර තීරණ ගැනීමට අවශ්‍ය නිසි තොරතුරු ලබා දීමද සිදු කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු නිවැරදිව සැලැසුම් නොකිරීම හේතුවෙන් මුදල් රෙගුලාසි 66 යටතේ වැය විෂයයන් 14 ක රු.81,504,354 ක් වූ ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් 09 කට මාරු කර තිබුණු අතර වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.10,889,360 ක අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. | අවශ්‍යතාවය හා ප්‍රවනතාවය මත මුදල් රෙගුලාසි 66 යටතේ හා පරිපූරක ඇස්තමේන්තු මඟින් භාණ්ඩාගාරයේ අනුමැතිය අනුව ප්‍රතිපාදන මාරු කිරීම් සිදු කර ඇතිබව. | මුදල් රෙගුලාසි 50 හි විධිවිධාන ප්‍රකාරව තාත්විකව හා නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළයුතු වීම හා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයන් උපයෝජනය කළයුතු වීම. |

**2.2** තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාලය වසර 2 ක් ඉක්ම වූ එකතු වටිනාකම රු.26,624,109 ක් වූ තැන්පතු ගිණුම් 3 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉතිරිව ඇති ශේෂ නිරවුල් කිරීම සඳහා අදාළ අංශ දැනුවත් කර ඇති බව. | මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

**2.3** අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශ ,දෙපාර්තමේන්තු හා පළාත් සභා ආයතන සඳහා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 16 දෙනෙකුගෙන්ද සේවය අවසන් කිරීම, සේවය අතහැරයාම හා විශ්‍රාමයාම හේතුවෙන් නිලධාරීන් 66 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.3,433,197 ක් වූ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීම සඳහා සිහි කැඳවීම් කර දැනුවත් කිරීම් සිදු කර ඇති බව හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය අය කර ගැනීමට විශ්‍රාම පාරිතෝෂිතය ලද වහාම කටයුතු කරන බව. | ණය ශේෂ අය කර ගැනීමට නොපමාව කටයුතු කළයුතු වීම. |

**2.4** බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැඳීම් හා බැරකම් ශේෂය, භාණ්ඩාගාරයේ බැඳීම් හා බැරකම් ශේෂය සමඟ සැසඳීමේ දී වැය විෂයයන් 16 කට අදාලව රු.12,977,769 ක් වැඩියෙන් ද වැය විෂයයන් 30 කට අදාලව රු.61,499,176 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන මඟින් දක්වා ඇති සියලු බැරකම් සිගාස් වැඩසටහන මඟින් ඇතුළත් කිරීමට 2020 අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා භාණ්ඩාගාර බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ බැරකම් අඩුවෙන් නිරූපණය වනබව. | වර්ෂයට අදාළ බැඳීම් හා බැරකම් නිවැරදිව බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි දැක්විය යුතුවීම. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුලදී නොගෙවන ලද 2019 දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 17 කට අදාලව පැවති රු.10,141,374 ක බැරකම්, බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණ ද භාණ්ඩාගාරයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | මු.රෙ.115 යටතේ අනුමැතිය ලබා ගෙන ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ 2019 ට අදාළ වවුචර් පත් මූල්‍ය ප්‍රකාශනයෙහි බැරකම් ලෙස ඉදිරිපත් කර ඇතිබව. | ගෙවා නිදහස් නොකරන ලද සියලු බැරකම් බැඳීම් හා බැරකම් ප්‍රකාශනයෙහි දැක්විය යුතුවීම. |

| | | |
|---|---|---|
| (ඇ) මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව පුනරාවර්තන වැය විෂයයන් 11 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 4 ක ඉතිරිවීම් ඉක්මවා පිළිවෙලින් රු.15,229,922 ක හා රු.1,774,366 ක බැරකම්වලට බැඳී තිබුණි. | තාක්ෂණ/කාර්මික විද්‍යාල වල නොගෙවූ බිල්පත් පැවතීම හේතුවෙන් සමස්ථ අයවැය මඟින් සලසා තිබූ ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹීමට සිදු වී ඇති බව. | මුදල් රෙගුලාසි 94(1) පරිදි කටයුතු කළ යුතුවීම. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බැංකු ගිණුම් 09 කට අදාලව එකතු වටිනාකම රු. 641,601ක් වූ නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ඉක්ම වූ චෙක්පත් 103 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කාලය ඉක්මගිය චෙක්පත් පිළිබඳ කටයුතු කිරීමට එක් එක් අංශය වෙත උපදෙස් ලබා දී ඇති අතර තොරතුරු ලද වහාම නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (ආ) ප්‍රධාන කාර්යාලයේ බැංකු ගිණුමකට අදාලව 2020 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2019 ජනවාරි 31 දින සිට 2020 ජූනි 25 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළව එකතුව රු.1,160,984 ක හඳුනා නොගත් ලැබීම් අවස්ථා 100 ක් හා එකතුව රු.637,882 ක් හඳුනා නොගත් ගෙවීම් අවස්ථා 64 ක් පැවතුණි. | තොරතුරු ලද වහාම හඳුනා නොගත් ලැබීම් හා ගෙවීම් හඳුනා ගෙන ඉදිරි කටයුතු කරනු ලබන බව. | හඳුනා නොගත් ලැබීම් හා ගෙවීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කළයුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

## 3.1 වත්කම් කළමනාකරණය

---------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 භාණ්ඩ සමීක්ෂණවලින් නිර්දේශ කර තිබූ අපහරණය කල යුතු භාණ්ඩ වර්ග 3259 ක් හා විකිණීමට නිර්දේශ කර තිබූ භාණ්ඩ වර්ග 5726 ක් සම්බන්ධව පිරිවැය වටිනාකම් හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල වත්කම් වල අගයන් පරිගණක මූලාශ්‍ර වලින් ඉවත් කර ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන වලින්ද ඉවත් කිරීමට කටයුතු කරනු ලබන බව. | භාණ්ඩ සමීක්ෂණයේ දී ඉදිරිපත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කළයුතු වීම. පිරිවැය වටිනාකම හඳුනා ගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කල යුතු වීම. |

## 3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 හා 881 (i) ප්‍රකාරව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව හා කාර්මික/තාක්ෂණ විද්‍යාල වල ඇප ලබා ගත යුතු නිලධාරීන් එම තනතුරට පත්කල දින සිට මාස 2 ක් ඇතුලත ඇප ලබාගත යුතු වුවත් කිසිදු නිලධාරියෙකුගෙන් ඇප ලබා ගෙන නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් හට මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප ලේඛණයක් නඩත්තු කරන ලෙස පරිපාලන අංශයට උපදෙස් ලබා දී ඇතිබව. | මුදල් රෙගුලාසි 880 හා 881 **(i)** ප්‍රකාරව කටයුතු කල යුතුවීම. |

## 3.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2012 වර්ෂයේ දී කාර්මික විද්‍යාලයක පැවති වෑන් රථයක් අනතුරට පත්වීම හේතුවෙන් සිදු වී තිබූ රු. 133,076 ක අලාභය රක්ෂණ ආයතනයෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | නීතිඥයෙකු වෙත අදාළ කටයුතු කරදෙන ලෙස දන්වා යවා ඇති අතර මහේස්ත්‍රාත් නඩු වාර්තා පිටපත් ලැබුණු විගස අලාභය අයකර ගැනීමට කටයුතු කරන බව. | අලාභය අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළයුතු වීම. |
| (ආ) නිසි පරිදි ඔයිල් හා ජලය යොදා ධාවනය නොකිරීම නිසා වාහනයක එන්ජිම 2011 මාර්තු 18 දින අකර්මන්‍ය වී ඇති බව පරීක්ෂණ වාර්තාවෙහි සඳහන් කර තිබුණි. මුදල් රෙගුලාසි 104 (4) යටතේ අලාභයන් පිළිබඳ අවසන් වාර්තාව අනුව ඉන් සිදු වූ රු. 1,737,568 ක අලාභයෙන් සියයට 40 ක් රියදුරුගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණ ද 2021 පෙබරවාරි 19 වන විගණන දිනය දක්වාම එකී අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එන්ජිම අකර්මණ්‍යය වීම සම්බන්ධව කරන ලද විධිමත් විනය පරීක්ෂණයෙන් ගත් තීරණය මත 2018 ජූලි සිට 2019 දෙසැම්බර් දක්වා මාසික වැටුපෙන් වාරික වශයෙන් අයකර ඇත. නිලධාරියා අමාත්‍යාංශ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර සහනයක් ලබා දීම සඳහා සලකා බලන ලෙස අමාත්‍යාංශ ලේකම් උපදෙස් ලබා දී ඇතිබව. | මු.රෙ. 104 (4) වාර්තාව අනුව අලාභය අය කර ගැනීමට කටයුතු කළයුතු වීම. |

## 3.4 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| වෑන් රථයක් සඳහා 2016 නොවැම්බර් 03 දින රු.961,908 ක් වැයකර ඉන්ධන විදුම් පොම්පයක් සවිකර තිබුණ ද නැවත 2019 මැයි 28 දින එනම් වසර 3 කටත් අඩු කාලයක් තුල නැවත ඉන්ධන කාන්දුවක් සිදුවන බව හඳුනාගෙන තිබුණි. දෝෂය නිවැරදි කර ගැනීමට නිලධාරීන් කටයුතු කර නොතිබීම නිසා ඉහත වියදම අනාර්ථික වියදමක් බවට පත්වීමට ඉඩ හැර ඇති බව නිරීක්ෂණය විය. | නියමිත අනුමැතියට යටත්ව 2016 වර්ෂයේදී සවිකල විදුම් පොම්පය දේශිය වෙලෙදපොල තුළලබා ගැනීමට ඇති ඉන්ධන වල භෞතික තත්ත්වය හා රථය ධාවනය කරන පරිසර තත්ත්වය ආදිය හේතුවෙන් එකී ඉන්ධන විදුම් පොම්පය වසර 3 කටත් අඩු කාලයකදී නැවත දෝෂ පෙන්වීම තුළ මින් ඉදිරියට එකී අන්දමේ අළුත්වැඩියාවන් සිදු කිරීම අත්හිටුවා ඇත. | දරන ලද වියදමින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට නිලධාරීන් කටයුතු කල යුතු වීම. |

## 3.5 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- | --- |
| (අ) | මහනුවර තාක්ෂණ විද්‍යාලයෙහි රාජකාරියෙහි නියුක්ත වන නිලධාරීන් හා සේවකයින් වසර 04-29 අතර කාලයක් ස්ථාන මාරු ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එකම ස්ථානයක සේවය කරමින් පැවතුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකළ යුතු වීම. |
| (ආ) | මහනුවර තාක්ෂණ විද්‍යාලයේ පසුගිය වර්ෂ 05 ක කාල සීමාව තුළ පාඨමාලා 49 කට අයත් සිසුන් 977 දෙනෙකු පාඨමාලා සම්පූර්ණ කිරීමකින් තොරව පාඨමාලා හැරගොස් තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පාඨමාලා හැර යාමට හේතු සොයා පිළියම් යෙදීය යුතුවීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>------------------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------- | නිර්දේශය<br>------------ |
| --- | --- | --- |
| ප්‍රධාන කාර්යාලය හා කාර්මික/තාක්ෂණ විද්‍යාලව 39 හි අධ්‍යන හා අනධ්‍යන අනුමත ස්ථීර කාර්යය මණ්ඩලය පිළිවෙලින් 1345ක් හා 2525 ක් වූ අතර තත්‍ය කාර්යය මණ්ඩලය පිළිවෙලින් 636 ක් හා 1651 ක් වූයෙන් පුරප්පාඩු පිළිවෙලින් 709 ක් හා 874 ක් විය. අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල බාහිර කථිකාචාර්යවරු හා බාහිර උපදේශකයින්ගේ සේවය ලබාගෙන රු.229,490,266 ක දීමනා ගෙවා තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා වූ පුරප්පාඩු කඩිනමින් පිරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |